# **යෝජිත සංශෝධන**

1. දැනට පවතින වගන්තිය

**5.1 (i) විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය යන නම් වලින් හැඳින් වූ දැනට කැළණිය විශ්ව විද්‍යාලය නමින් හැඳින්වෙන මින්පසු මෙම විශ්ව විද්‍යාලය යනුවෙන් සඳහන් කරනු ලබන මෙම ආයතනයේ ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලැබූවකු වීම, පිළිගත් වෙනත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යන හෝ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුක්ත අයකු වීම.**

**යෝජිත වගන්තිය**

**5.1 (i) විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය යන නම් වලින් හැඳින් වූ දැනට කැළණිය විශ්ව විද්‍යාලය නමින් හැඳින්වෙන මින්පසු මෙම විශ්ව විද්‍යාලය යනුවෙන් සඳහන් කරනු ලබන මෙම ආයතනයේ ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලැබූවකු වීම.**

2. දැනට පවතින වගන්තිය.

**සම්මානිත සාමාජිකත්වය පිරිනැමීම.**

**විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය සඳහා ආදර්ශවත් සේවයක් ඉටු කළ භවතුන් මෙම සම්මානිත සාමාජිකත්වය පිරිනැමීමට මෙම සමිතියේ විධායක සභාවට නීත්‍යානුකූල අයිතියක් ඇත. එහෙත් එබඳු සාමාජික සංඛ්‍යාව වර්ෂයකට දහ දෙනෙකුට නොවැඩි විය යුතුය.**

යෝජිත වගන්තිය

5.1(ii)සම්මානිත සාමාජිකත්වය පිරිනැමීම.

1 **විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය සඳහා ආදර්ශමත් සේවයක් ඉටුකළ හෝ ඉටු කරමින් සිටින භවතුන් වෙත සම්මානිත සාමාජිකත්වය පිරිනැමීමට මෙම සමිතියේ විධායක සභාවට නීත්‍යානුකූල අයිතියක් ඇත. එහෙත් එබඳු සාමාජිකයින් සංඛ්‍යාව දස දෙනෙකුට නොවැඩි විය යුතුය.** පිළිගත් වෙනත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධි පාඨමාලාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුක්ත අයකුටද සම්මානිත සාමාජිකත්වය ලබා දිය හැකි අතර ඔවුනට සංගමයේ විධායක කමිටුවට පත්විමේ හැකියාව ඇත.

3. දැනට පවතින වගන්තිය.

**5.3 සාමාජික ගාස්තු**

5.3 :(1) යාවජීව සාමාජික මුදල රුපියල් 500කි. මෙය එකවර ගෙවිය යුතුය ඒ අනුව ලියාපදිංචි අංකයක් ලබාදිය යුතු ය.

**යෝජිත වගන්තිය.**

**5.3 (i) යාවජීව සාමාජික මුදල**

**රුපියල් 1000කි. මෙය එකවර ගෙවිය යුතුය. ඒ අනුව ලියාපදිංචි අංකයක් ලබාදිය යුතුය. අයදුම්කරු මෙම ව්‍යවස්ථාවට අනුකූල ව්‍යවස්ථාවක් සහිත දිස්ත්‍රික් සංගමයක/ ශාඛාවක යාවජීව සාමාජිකයකු වන්නේ නම් ඒ අයදුම්කරුගෙන් සාමාජික මුදල් අයකර ගත යුතු නොවේ. එහෙත් අදාල දිස්ත්‍රික් සංගමය විසින් රුපියල් 500ක මුදලක් අදාල සාමාජිකයා** වෙනුවෙන් මෙම සමිතියට ගෙවිය යුතු වේ. දිස්ත්‍රික් සංගමයක දැනටමත් සාමාජිකයකු වන අයට මෙම සංගමයේ සාමාජිකත්වය පිරිනමන විට ඔවුන් වෙනුවෙන් අයකරගත හැක්කේ නිකුත් කරනු ලබන හැඳුනුම් පත සඳහා වන වියදම පමණි.

4. දැනට පවතින වගන්තිය.

**8.1(ii) සමිතියේ සියළුම නිලධාරීන්/ කාරක සභිකයින් මෙම රැස්වීමේදී තෝරාපත් කර ගත යුතුය. සියලු නිලධාරීන්ගේ සහ කාරක සිභික සාමාජිකයන්ගේ නිල කාලය එක් වසරකි.**

**යෝජිත වගන්තිය.**

**8.1(i) 18.5(ii) වගන්තියේ සඳහන් සියලුම නිලධාරීන් සහ කාරක සභිකයින් සහ සමස්ථ ලංකා කාරක සභිකයන් මෙම රැස්වීමේදී තෝර ගත යුතුය. සියලු නිලධාරීන්ගේ සහ කාරක සභික සාමාජිකයින්ගේ නිල කාලය එක් වසරකි.**

5. දැනට පවතින වගන්තිය.

**8.1(v) වාර්ශික මහ සභාව පැවැත්විය යුතුය නොවැළක් විය හැකි හේතුවක් නිසා නොවේ නම්, සමිතියේ වාර්ශික මහ සභා රැස්වීම සෑම වර්ෂයකම මාර්තු මාසයේදී කැඳවිය යුතුය. ගත වූ වර්ෂය පිළිබඳව පූර්ණ වාර්තාවක් ලේකම් විසින් සංවත්සර මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.**

**යෝජිත වගන්තිය.**

8.1(v) පසු ගිය වසරේ පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව ලේකම් විසින්ද,පසුගිය වසරතුල සංගමයේ ක්‍රියාකාරිත්වයට අදාල ප්‍රගති වාර්තාව් සභාපති විසින්ද එම වසරට අදාල විගණනය කරන ලද **ගිනුම්** වාර්තාව භාණ්ඩාගාරික විසින්ද මහා සභා රැස්විමට ඉදිරිපත් කළයුතුය.

6. දැනට පවතින වගන්තිය

8.1(vi) මෙහිදී විධායක සභාව කාරක සභාව සමස්ත ලංකා කාරක සභාව යන සභාවන් සඳහා සාමාජිකයින් පත් කර ගත යුතුය.

යෝජිත වගන්තිය

8.1(vi) වගන්තිය තුරන් කොට 8.1(vii) වගන්තිය 8.1(vi) වශයෙන් නම් කළ යුතුය.

7. 8.2 විශේෂ මහ සභා රැස්වීම්.

දැනට පවතින වගන්තිය

8.2(i) කාරක සභා යෝජනාවක් මගින් හෝ සාමාජිකයින් 8 ට නොඅඩු හෝ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 යන දෙකෙන් නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත විශේෂ මහ සභා රැස්වීමක් කැදවිය හැක. විශේෂ මහ සභා රැස්වීමේ යෝජනාව ඉදිරිපත් වී දින 21ක් ඉකුත් වීමට පෙර ලේකම් තුමා විසින් එම මහ සභාව කැඳවිය යුතුය.

යෝජිත වගන්තිය.

8.2(i) කාරක සභා යෝජනාවක් මගින් හෝ සාමාජිකයින් 50 කට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ ඉල්ලීම මත විශේෂ මහ සභා රැස්වීමක් කැදවිය හැක. විශේෂ මහ සභා රැස්වීමේ යෝජනාව ඉදිරිපත් වී දින 21ක් ඉවත් වීමට පෙර ලේකම්වරයා විසින් එම මහ සභාව කැඳ විය යුතුය.

8. දැනට පවතින වගන්තිය.

8.4(iii) සමස්ත ලංකා සංවිධායක මණ්ඩල රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේ විධායක සභාව විසින් නම් කරනු ලබන සංසදයේ උප සභාපතිවරයකු විසිනි.

යෝජිත වගන්තිය.

8.4(iii) සමස්ත ලංකා කාරක සභා රැස්වීම්වල මුලසුන මෙම සංගමයේ සභාපති විසින්ද ඔහු හෝ ඇය නොමැති විට නියෝජ්‍ය සභාපතිවරයා විසින්ද ඔහු හෝ ඇය නොමැති විට උප සභාපතිවරයකු විසින්ද දැරිය යුතුය.

9. දැනට පවතින වගන්තිය

8.4(v) සමස්ත ලංකා කාරක සභා රැස්වීම්වල ගණ පූර්ණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට හෝ අඩු විය යුතුය.

යෝජිත වගන්තිය

8.4(v) වගන්තිය ඉවත් කොට 8.4(vi) වගන්තිය 8.4(v) වශයෙන් නම් කළ යුතුය.

10. දැනට පවතින වගන්තිය.

8.5 ගණ පූර්ණය

I. සංවත්සර මහ සභාව මුළු සාමාජිකයින් 2/3
II. විශේෂ මහ සභා රැස්වීම මුළු සාමාජිකයින් 1/3
III. විධායක සභා රැස්වීම 1/3
IV. කාරක සභා රැස්වීම 1/2

යෝජිත වගන්තිය.

8.5 ගණපූර්ණය

I. සංවත්සර මහ සභාව මුළු සාමාජිකයින් 75
II. විශේෂ මහ සභා රැස්වීම මුළු සාමාජිකයින් 50
III. විධායක සභා රැස්වීම ඒ සමාජිකයන්ගෙන් 1/3
IV. සමස්ත ලංකා කාරක සභා රැස්වීම ඒ සාමාජිකයන්ගෙන් 1/3

11. දැනට පවතින වගන්තිය.

10. මොන නාමයකින් වුවද පාලක කාරක සභාවේ භාණ්ඩාගාරික සහ අනු නිලධාරීන්ද භාරකාරයන්ද පත් කිරීම සහ ඉවත් කිරීම.

යෝජිත වගන්තිය

10. මහ සභාවේදී 18.5 වගන්තිය පරිදි පත් වූ ඕනෑම නිලධාරියකු හෝ සභිකයකු ඉවත් කිරීම සහ අනුප්‍රාප්තිකයින් පත් කිරීම.

12. දැනට පවතින වගන්තිය.

10.1 නිලධාරීන්, අනු නිලධාරීන්, කාරක කමිටු සාමාජිකයින්, භාරකරුවන් සංවත්සර මහ සභාවේදී පත් කර ගත යුතුය.

යෝජිත වගන්තිය

10.1 වගන්තිය ඉවත් කොට 10.(ii) සහ 10.(iii) යන වගන්ති පිළිවෙලින් 10(i) සහ 10(ii) වශයෙන් නම් විය යුතු අතර පහත සඳහන් වගන්තිය 10 (iii) ට ආදේශ කළ යුතුය.

10(iii) ඉල්ලා අස් වූ හෝ ඉවත් කරන ලද විධායක කමිටුවේ නිලධාරියකු නිසා ඇති වූ පුරප්පාඩුව පවතින විධායක සභාව තුළින්ම තෝරා ගැනීමට විධායක සභාවට හැකියාව ඇත. කාරක සභික තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට එම තනතුර සඳහා සුදුසු අයකු සාමාජිකත්වය තුළින් පත් කිරීමේ හැකියාව විධායක සභාවට ඇත .

13. දැනට පවතින වගන්තිය.

11.අරමුදල් ආයෝජනය කිරීම.

සමිතියට ලැබෙන සියලුම මුදල්, චෙක්පත් යානාදිය සමිතිය නමින් ලංකා බැංකුවේ කැළණිය ශාඛාවේ විවෘත කර ඇති ගිණුමට බැර කළ යුතුය.

යෝජිත වගන්තිය.

11 සංගමයේ ගිණුම් පවත්වාගෙන යාම සහ අරමුදල් ආයෝජනය කිරීම.

සංගමයට ලැබෙන සියලුම මුදල්, චෙක්පත් යනාදිය විධායක සභාව විසින් තීරණය කරනු ලබන රාජ්‍ය බැංකුවක සංමය නමින් විවෘත කරනු ලබන ඉතිරි කිරීමේ ගිණුමක/ගිණුම්වල හා ජංගම ගිණුමක/ ගිණුම්වල තැන්පත් කළ යුතු වේ. සංගමයේ අරමුදල් විධායක සභාව විසින් තීරණය කරනු ලබන රාජ්‍ය බැංකුවක හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත රාජ්‍ය මූල්‍ය ආයතනයක ස්ථාවර තැන්පතුවල හෝ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු වේ.

14. දැනට පවතින වගන්තිය.

13. වර්ෂයකට වරක් ගණන් පරික්ෂා කිරීම.

සමාගම් පණත යටතේ ලියාපදිංචි විගණනවරයකු ලවා වර්ෂයකට වරක් විගණන වාර්තාවන් ලබා ගත යුතුය.

යෝජිත වගන්තිය.

13 සමිතියේ ගිණුම් විගණනය කිරීම.

සමාගම් පණත යටතේ ලියාපදිංචි විගණනවරයෙකු ලවා වර්ෂයකට වරක් සමිතියේ මූල්‍ය වර්ෂයට අදාල සියලුම ගිණුම් විගණනය කොට වාර්තාවන් ලබා ගත යුතුය.

15 දැනට පවතින වගන්තිය

14. වාර්ෂික වාර්තා

අය, අරමුදල් බඩු බාහිරාදිය හා වැය පිළිබඳ විස්තරද නව නිලධාරි මණ්ඩලයේ සම්පූර්ණ නම් හා ලිපින ලයිස්තුවද නව සාමාජික ලේඛනයද මහාසභා රැස්වීම් වාර්තාද වාර්ෂිකව ජුනි 01 වන දිනට පෙර සමිති රෙජිස්ට්‍රාර් වෙත සැපයීම කළයුතුය.

14. යෝජිත වගන්තිය

සමාගම් රෙජිස්ටාර් වෙත වාර්ෂිකව තොරතුරු සැපයීම

සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විගණන සමාගමක් විසින් විගණනය කොට සහතික කරන ලද සංගමයේ වාර්ෂික ගිණුම් වාර්තාව සහ 18.5(11) වගන්තිය යටතේ පත්වූ නිලධාරි මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් ඇතුලත් ලැයිස්තුවක් සහ සංගමයේ සමාජික ලැයිස්තුවක් සෑම වසරකම ජුනි 01 වන දිනට ප්‍රතම සමාගම් රෙජිස්ට්‍රාර් වෙත සැපයිය යුතුය.

16. දැනට පවතින වගන්තිය.

15. සමිතියේ සාමාජික සංඛ්‍යාව දැනට සිටින සාමාජික සංඛ්‍යාව 08 කි.

යෝජිත වගන්තිය

15. සමිතියේ ආරම්භක සාමාජික සංඛ්‍යාව - මෙම ව්‍යවස්ථාව අනුමතවන විට එතෙක් "කැළණිය විශ්ව විද්‍යාලයීය ආදී විද්‍යාර්ථයින්ගේ සංගමයේ." සාමාජිකත්වය ලබා සිටි සියලුම සාමාජිකයින් මෙම සමිතියේ ආරම්භක සාමාජිකයින් වේ.

17. දැනට පවතින වගන්තිය.

17. සමිතිය සහ එහි සාමාජිකයන් අතර හෝ සාමාජිකයකුගේ මාර්ගයෙන් නැතහොත් සමිතියේ ව්‍යවස්ථාව යටතේ හිමිකම් කියනු ලබන පුද්ගලයකු අතර හෝ පැන නගින ගැටලු විමසන ආකාරය.

මේ සඳහා අවම වශයෙන් ප්‍රධාන නිලධාරී 2ක් සහ කාරක මණ්ඩල සාමාජිකයින් 3 ගෙන් සමන්විත අනු කමිටුවක් මගින් ගැටලුව සම්බන්ධ පුද්ගලයින් කැඳවා පරීක්ෂණයක් පවත්වා සාධාරණ විසඳුමක් ලබා දීමට කටයුතු කළ යුතුය.

යෝජිත වගන්තිය

17. සංගමය සහ එහි සාමාජිකයන් අතර හෝ සාමාජිකයකුගේ මාර්ගයෙන් නැතහොත් සංගමයේ ව්‍යවස්ථාව යටතේ හිමිකම් කියනු ලබන පුද්ගලයකු අතර හෝ පැන නගින ගැටලු විමසන ආකාරය.

මේ සඳහා අවම වශයෙන් සංගමසයේ සභාපති, ලේකම්,භාණ්ඩාගාරික යන අයගෙන් එක් අයකුගෙන් ද කාරක සභික සාමාජිකයින් 3 ගෙන් සමන්විත අනු කමිටුවක් මගින් ගැටලුව සම්බන්ධ පුද්ගලයින් කැඳවා පරීක්ෂණයක් පවත්වා සාධාරණ විසඳුමක් ලබා දීමට කටයුතු කළ යුතුය.

18. දැනට පවතින වගන්තිය.

18.1(i) විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හෝ අනදයයන කාර්ය මණ්ඩලයට අයත් නොවන සමස්ත ආදි විද්‍යාර්ථීන් වෙනුවෙන් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන් විසි එක් දෙනෙක්ද.

18.1(ii) විශ්ව විද්‍යාලයේ අධ්‍යන හෝ අනද්‍යන සේවයෙහි නියුක්ත ආදි විද්‍යාර්ථීන්ගෙන් නියෝජිතයන් දස දෙනෙක්ද.

18.1(iii) මෙයින් තුන් දෙනෙකු වාර්ෂික මහ සභා රැස්වීට දින 14කට කලින් තෝරාගත හැකි පරිදි විධායක සභාව විසින් ප්‍රවර්ථමාන වැඩ පිළිවෙල සකස් කළ යුතුය.

යෝජිත වගන්තිය.

18.1(i) විශ්ව විද්‍යාලයේ අධ්‍යන හෝ අනද්‍යන කාර්ය මණ්ඩලයට අයත් නොවන සමස්ථ ආදි විද්‍යාර්ථීන් වෙනුවෙන් තෝරා පත් කර ගනු ලබන නියෝජිත<u>යන්</u> විසි දෙදෙනෙක්ද <u>(22)</u>

18.1(ii) විශ්ව විද්‍යාලයේ අධ්‍යන හෝ අනද්‍යන සේවයෙහි නියුක්ත ආදි විද්‍යාර්ථීන්ගෙන් නියෝජිතයන් දහනව දෙනෙක්ද (19)

18.1(iii) 18.1(ii) වගන්තියේ සඳහන් දහනව දෙනාගෙන් 6 දෙනෙකු වාර්ෂික මහා සභා රැස්වීමට දින 14කට කලින් තෝරා ගත හැකි වන පරිදි විධායක සභාව විසින් අවිච්චින්න වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.

19. දැනට පවතින වගන්තිය.

18.4 ශාඛා සමිති පිහිටුවා ගැනීම.

18.4(iv) විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වී ඇති විෂයයන් සහ වර්ෂය අනුව සංවිධානය වූ ආදි විද්‍යාර්ථීන්ගේ සමිති නියෝජනය වන පරිදි පහළොස් (15) දෙනෙකුද,

යෝජිත වගන්තිය

විශ්ව විද්‍යාලයේ ලියා පදිංචි වි ඇති විෂයයන් පීඨ සහ වර්ෂයන් අනුව සංවිධානය වු

15 කුට නොඅඩු සමාජික සංඛ්‍යාවකින් යුත් ආදි විද්‍යාර්ථීන්ගේ සමිති මෙම සංගමයට අනුබද්ධ විය හැක.

20. දැනට පවතින වගන්තිය

18.4(v) සෑම දිස්ත්‍රික් සංසදයක්ම තම සංවිධානය සඳහා ව්‍යවස්ථාවක් සම්මත කරගත යුතු අතර එය මව් සමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය එසේ සම්මත කර ගන්නා ලද ව්‍යවස්ථවේ පිටපතක මව් සමිතියේ අනුමැතිය සඳහා භාරදිය යුතුය

යෝජිත වගන්තිය

18.4(v) සෑම දිස්ත්‍රික් සමිතියක්/ සංගමයක් තම සංවිධානය සඳහා ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතුය. එය මෙම සමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය. එසේ සම්මත කරගන්නා ලද ව්‍යවස්ථාවේ පිටපතක් මෙම සංගමයේ අනුමැතිය සඳහා භාර දිය යුතුය.

21. දැනට පවතින වගන්තිය.

18.5 (i) මෙම සමිතියේ නිලධාරීන් මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය.

සභාපති, නියෝජ්‍ය සභාපතිවරයෙක්, උපසභාපතිවරු දෙදෙනෙක්, ලේකම්, උපලේකම්වරු දෙදෙනෙක්, සම්බන්ධීකරණ ලේකම්, භාන්ඩාගාරික, උපභාණ්ඩාගාරික, සංවිධායකවරු දෙදෙනෙක්, ප්‍රචාරක නිලධාරි, සෙසු විධායක සභිකයන්.

යෝජිත වගන්තිය.

18.5 (i) මෙම සංගමයේ නිලධාරී මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය.

සභාපති, ලේකම්, භ්ණ්ඩාගාරික,නියෝජ්‍ය සභාපතිවරයෙක්, උප සභාපතිවරු දෙදෙනෙක්, නියෝජ්‍ය ලේකම්, උප ලේකම්වරු දෙදෙනෙක්, උපභාණ්ඩාගාරික, ජාතික සංවිධායක, ප්‍රචාරක ලේකම්, සෙසු විධායක සභිකයන 29 මුලු සංඛාව 41 .

22. දැනට පවතින වගන්තිය.

18.5(ii) මෙම තනතුරු සඳහා නිලධාරීන් පත් කර ගත යුත්තේ වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව රැස්වන විධායක සභා රැස්වීමේදී එහි සාමාජිකයින් අතුරිනි.

යෝජිත වගන්තිය.

18.5(ii) තුරන් විය යුතු අතර 18.5(iii) සහ 18.5(iv) යන වගන්ති පිළිවෙලින් 18.5(ii) සහ 18.5(iii) වශයෙන් නම් විය යුතුය.

23. දැනට පවතින වගන්තිය.

18.5 (v) ආ

උප ලේකම්වරු දෙදෙනෙක්ගෙන් එක් අයෙකු සමස්ත ලංකා සංවිධායක මණ්ඩලයේ ලේකම් ලෙසද, තවත් අයෙකු දිස්ත්‍රික් හා විදේශ සංසදයන්හි සම්බන්ධීකරණ ලේකම් ලෙසද ක්‍රියා කළ යුතුය. මෙම දෙදෙනාට අදාළ පාර්ශ්වයන් සමග ලිපි ගනුදෙනුවලට බලය පැවරෙන අතර අදාල ලේඛන විධායක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

යෝජිත වගන්තිය.

18.5(v) ආ

දිස්ත්‍රික් සහ විදේශීය සංගම් සම්බධීකරණය සහ සමාජික ප්‍රවර්ධන කටයුතු ජාතික සංවිධායකගේ වගකීම වේ.

නියෝජ්‍ය ලේකම් විසින් අභ්‍යන්තර කමිටු ලේකම්වරු හා සම්බන්ධීකරණ කටයුතු කෙරෙන අතර විධායක සභා රැස්වීම් වලට අදාල වාර්තා හා සටහන් තබා ගැනීමේදී ලේකම්ට සහාය ලබා දිය යුතුය. උප ලේකම්වරු දෙදෙනෙක්ගෙන් එක අයෙකු සමස්ත ලංකා සංවිධායක මණ්ඩලයේ ලේකම් සහ දිස්ත්‍රික් හා විදේශ සංසදයන්හි සම්බන්ධීකරණ ලේකම් ලෙසද, ක්‍රියා කළ යුතුය. උප ලේකම් විසින් සංගම් කාර්යාලයේ දත්ත පද්ධතිය භාරව කටයුතු කළයුතු වේ. මෙම තිදෙනාට අදාළ පාර්ශවයන් සමඟ ලිපි ගනුදෙනුවලට බලය පැවරෙන අතර අදාළ ලේඛන විධායක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

24. දැනට පවතින වගන්තිය.

18.6 සමිතියේ නිලධාරී මණ්ඩලයේ වර්තමාන සංයුතිය.

| | |
|---|---|
| සභාපති | - 1 |
| උප සභාපති | - 1 |
| ලේකම් | - 1 |
| උප ලේකම් | - 1 |
| භාණ්ඩාගාරික | - 1 |
| කාරක සභික | - 3 |
| මුළු සංඛ්‍යාව | - 8 |

යෝජිත වගන්තිය 18.6 වගන්තිය ඉවත්කළයුතුයි

| | |
|---|---|
| සභාපති | - 1 |
| ලේකම් | - 1 |
| නියෝජ්‍ය සභාපති | - 1 |
| උප සභාපතිවරු | - 2 |
| ජාතික සංවිධායක | 1 |
| නියෝජ්‍ය ලේකම් | - 1 |

| | |
|---|---|
| **උප ලේකම්වරු** | **- 2** |
| **භාණ්ඩාගාරික** | **- 1** |
| **උප භාණ්ඩාගාරික** | **- 1** |
| **ප්‍රචාරක ලේකම්** | **- 1** |
| **සෙසු කාරක සභිකයන්** | **- 29** |
| **මුළු සංඛ්‍යාව** | **- 41** |

**වෙනත් යෝජනා**

**පහත සදහන් වෙනත් යෝජනා විධායක සභාවේ අවධානයට යොමු කරමු**

1 **විවස්ථාවේ දැනට ඇති ප්‍රතිපාදන භාවිතා කරමින් මුල් සාමාජිකයන්ට අතිරේකව දැනට ඇති අනිකුත් සමාජිකයන් සියළුදෙනා** විධායක සභාවේ යොජනා ස්ථිරත්වයෙන් ඇතුලත් කරගත යුතුය.

2 **5 .3 (ii) සදහා සාමාජික මුදල මවු සංගමය හා සාඛා සංගමය අතර බේදි යාම පැහැදිලි නොමැති බැවින් මේ සම්බන්ධව විධායක සභාව සමාලෝචනයක් කිරීම** මැනවි.

3 වීවස්ථාවේ 8.1 (ii)වගන්තියේ සදහන් කරුනු 18 5 (ii) වගන්තියේ සදහන් වන බැවින්

4 8. 1(ii) වගන්තිය ඉවත්කල යුතුය

5 පවතින විවස්ථාවේ සංගමයේ නම සදහන් කරන ඇතැම් අවස්ථාවල සංසදය නමින්ද සදහන් වන බැවින් එය නැවත සංසෝධනය විය යුතුය